# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/19 - 2016 මැයි මස 11 වැනි බදාදා - 2016.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

මගේ අංකය :- 01/10/03/04

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ඌව පළාත් ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154ඊ. ව්‍යවස්ථාවේ (4) හා (05) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඌව පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍ය ගරු රත්නායක මුදියන්සේලාගේ කුමාරසිරි රත්නායක මැතිතුමා

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් අමාත්‍ය ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා 2016 මැයි මස 09 වැනි දින සිට 2016 මැයි මස 18 වැනි දින දක්වා විදේශගත වන හෙයින්, 2016 මැයි මස 09 වැනි දින සිට එතුමා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක්, ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය ධූරයෙහි හා එකී විෂයභාර අමාත්‍ය ධූරයෙහි වැඩ බැලීමට

ඇම්. පී. ජයසිංහ,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2016 මැයි මස 08 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

05-839